# <u>නියමයන් සහ කොන්දේසි - Savings Pot</u>

පහත සඳහන් නියමයන් සහ කොන්දේසි FriMi හරහා විවෘත කරන ලද සියලුම Savings Pot ගිණුම් පාලනය කරනු ඇත.

**පහත "පිළිගනිමි" යන බොත්තම එබීමෙන්, ගනුදෙනුකරු පහත පරිදි**

> **එනම් මෙම නියමයන් සහ කොන්දේසි, Savings Pot නිපැයුමට අදාළ විස්තර සමඟ ගනුදෙනුකරුට පැහැදිලි කර ඇති බවත් ගනුදෙනුකරු මෙම නියමයන්, කොන්දේසි සහ එවැනි විස්තර කියවා තේරුම් ගෙන ඇති බවත් ඒ අනුව බැඳී සිටීමට එකඟ වන බවත් පිළිගෙන තහවුරු කරයි.**

## SAVINGS POT ගිණුම විවෘත කිරීම

1. Savings Pot ගිණුමක් විවෘත කළ හැක්කේ **ගනුදෙනුකරු හඳුනා ගන්න** (KYC) සත්‍යාපනය සම්පූර්ණ කිරීම අනුව බැංකුව විසින් සක්‍රිය කර ඇති FriMi ඉතුරුම් ගිණුමක් ඇති ගනුදෙනුකරුවකුට පමණි.
2. Savings Pot ගිණුමක් විවෘත කළ හැක්කේ FriMi යෙදුම හරහා පමණි.
3. FriMi යෙදුම හරහා ගනුදෙනුකරුට උපරිම වශයෙන් Savings Pot ගිණුම් පහක් (05) සෑදිය හැක. (ගනුදෙනුකරුට දැනුම් දීමක් සහිතව කිසියම් අවස්ථාවක දී බැංකුව විසින් අන් ආකාරයකින් සංශෝධනය නොකළහොත් මිස).
4. මෙම නියමයන් සහ කොන්දේසි පිළිගැනීමෙන්, ගනුදෙනුකරු විසින් බැංකුවට සපයන ලද නවතම KYC තොරතුරු භාවිතා කරමින් ගනුදෙනුකරුගේ නමින් Savings Pot ඉතුරුම් ගිණුමක්/ ගිණුම් විවෘත කිරීමට සිය කැමැත්ත පළ කර බැංකුවට බලය පවරයි.
5. Savings Pot ගිණුමක් හරහා සිදු කෙරෙන බැර සහ හර කිරීම්, FriMi ඉතුරුම් ගිණුමෙන් Savings Pot ගිණුමට සහ Savings Pot ගිණුමෙන් FriMi ඉතුරුම් ගිණුමට ලෙස සිදු කෙරෙන මාරුකිරීම් වලට සීමා කෙරේ.
6. සෑම Savings Pot ගිණුමක්ම FriMi හි පවත්වාගෙන යනු ලබන ගිණුම් ශ්‍රේණියට වැටෙන අතර Savings Pot ගිණුම් සම්බන්ධයෙන් අදාළ වන පොලී අනුපාතය සහ බදු FriMi යෙදුම තුළ ප්‍රකාශයට පත් කෙරේ.
7. Savings Pot සඳහා පවත්වාගෙන යා යුතු අවම තැන්පතු මුදලක් නොමැත.
8. Savings Pot ගිණුම් විවෘත කිරීමේ මුදල් ශ්‍රී ලංකා රුපියල් වලට සීමා කෙරේ.
9. Savings Pot ගිණුම තනි පුද්ගල ගිණුම් වලට සීමා කෙරේ.
10. Savings Pot ගිණුම් සඳහා ඉලෙක්ට්‍රොනික ගිණුම් ප්‍රකාශ නිකුත් නොකෙරේ. පවතින බැංකු ගාස්තුවලට යටත්ව සිදු කරන ඉල්ලීම් මත පමණක් කඩදාසි පදනම් කරගත් ගිණුම් ප්‍රකාශ නිකුත් කරනු ලබයි.
11. ගනුදෙනුකරුට FriMi යෙදුම හරහා Savings Pot ගිණුම්වල ගනුදෙනු ඉතිහාසය බැලිය හැක.

## SAVINGS POT ගිණුම් අවසන් කිරීම

12. ගනුදෙනුකරුට ඕනෑම අවස්ථාවක Savings Pot ගිණුම වසා දැමිය හැකි අතර එවිට එහි ඇති මුදල් ස්වයංක්‍රීයව FriMi ඉතුරුම් ගිණුමට මාරු වේ.

13. ගනුදෙනුකරුට දැනුම්දීමක් ලබා දී Savings Pot ගිණුම වසා දැමීමට බැංකුවට අයිතියක් ඇති අතර එවැනි වසා දැමීමකදී එහි ඇති මුදල් FriMi ඉතුරුම් ගිණුමට මාරු කෙරේ.

## විවිධ

14. මෙහි සඳහන් කර ඇති ප්‍රතිවිරුද්ධ වූ කිසිවක් නොසළකා, ගනුදෙනුකරුගේ Savings Pot ගිණුම සමඟ ගනුදෙනුකරු බැංකුව වෙත ඇති ඕනෑම වගකීමක් ඒකාබද්ධ කිරීමට සහ එවැනි වගකීම් සත්‍ය හෝ අවිනිශ්චිත ද, ප්‍රාථමික හෝ ඇපකර සහිත ද සහ එක්ව හා වෙන් වෙන්ව ද යන්න අනුව වෙනත් ඕනෑම ගිණුමක් මත හෝ වෙනත් කරුණක් සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතු වෙනත් මුදලකට එදිරිව Savings Pot ගිණුමෙන් බැර

කිරීමට යම් මුදලක්/හිමි මුදලක් නියම කිරීමට හෝ මාරු කිරීමට ගනුදෙනුකරු සිය කැමැත්ත පළ කර බැංකුවට බලය පැවරීමයි.

15. ඕනෑම අවස්ථාවක මෙම නියමයන් සහ කොන්දේසි සංශෝධනය කිරීමේ අයිතිය බැංකුව සතු වේ. එවැනි වෙනස්වීම් පිළිබඳව ගනුදෙනුකරු දැනුවත් කරනු ඇත.

16. මෙහි අන් ලෙසකින් නිර්වචනය කර නොමැත්තේ නම් මිස, මෙම නියමයන් සහ කොන්දේසි වල ඉංග්‍රීසි කැපිටල් අකුරින් දක්වන ලද නියමයන් ද ගනුදෙනුකරු විසින් දැනටමත් පිළිගෙන ඇති FriMi නියමයන් සහ කොන්දේසි වල ("ප්‍රධාන ගිවිසුම") දක්වා ඇති අර්ථයම ගනී.

17. මෙම නියමයන් සහ කොන්දේසි ප්‍රධාන ගිවිසුමේ විධිවිධාන සහ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර නියමයන් සහ කොන්දේසි (ඉල්ලීම මත ලබා ගත හැකි පිටපත්) සමඟ කියවිය යුතුය. එවැනි නියමයන් සහ කොන්දේසි මෙහි ඇතුළත් කර තිබේද නැද්ද යන්න නොසලකමින් ගනුදෙනුකරු එවැනි සියලුම නියමයන් සහ කොන්දේසිවලට බැඳී සිටී.

**අර්ථ දැක්වීම්**

**"බැංකුව"** යන්නෙන් නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. (PQ 118) අදහස් වේ.

**"Savings Pot ගිණුම"** යන්නෙන් අදහස් වන්නේ ගනුදෙනුකරුවන් සඳහා ලබා ගත හැකි විකල්ප අංගයක් වන Nations saver බැංකු ගිණුමක් ගණයට වැටෙන බැංකු ගිණුම් නිපැයුමට කි.

**˜KYC˜** යන්නෙන් අදහස් වන්නේගනුදෙනුකරු හඳුනාගන්න යන්නය.